# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

## කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය

***Higher Diploma in Teaching Methodology & Education Management (HDTMEM)***
***Professional Diploma in Teaching Technology & Methodology (PDTTM)***

## උසස් ඩිප්ලෝමා පාඨමාලාව - ඉගැන්වීමේ ක්‍රමවේදයන් සහ අධ්‍යාපන කළමණාකරණය
## වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලාව - ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදයන්

**ශ්‍රී ලංකාවේ ජාතික විශ්වවිද්‍යාලයකින් ගුරු වෘත්තිය පිළිබඳ ඉහල මට්ටමේ සුදුසුකමක් සපුරා ගැනීමට සුවිශේෂී අවස්ථාවක්**

### I. ඉගැන්වීමේ ක්‍රමවේදයන් සහ අධ්‍යාපන කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (HDTMEM) -මාස 15 ක සතිඅන්ත පාඨමාලාව (Higher Diploma in Teaching Methodology and Education Management)

- ගුරුවෘත්තියේ යෙදී සිටින්නන්ට මෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයේ රැකියා අපේක්ෂාවෙන් සිටින උපාධි අපේක්ෂකයනට වෘත්තීය සුසුකමක් වන පාඨමාලාවකි.
- වෘත්තීය පලපුරුද්ද ඇති අයට උපාධි පාඨමාලාවක් හැදෑරීමට මූලික සුදුසුකමක් ලෙස සැලකිය හැකි SLQF –IV/ NVQL -VI මට්ටමේ පාඨමාලාවකි.
- ප්‍රවීණ විශ්වවිද්‍යාල ආචාර්ය මඩුල්ලක් විසින් මෙහෙයවනු ලබන ඉගෙනුම් න්‍යාය හා ක්‍රමවේදයන්, අධ්‍යාපන දර්ශනය, අධ්‍යාපන මනෝවිද්‍යාව, ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනය, ඇගයීම් ක්‍රම සහ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් ඇතුලත් පාඩම් මාලා 45ක් හා ක්ෂේත්‍ර අධ්‍යයන සැසි අධ්‍යයන හා සාකච්ඡා ඇතුලත් මාස 15 ක සති අන්ත පාඨමාලාවකි.
- ඉගෙනුම් කාර්ය සාධන වාර්තාව, ඉගෙනුම් ඉදිරිපත්කිරීම් සහ පැවරුම් පාදක අගැයීම් ක්‍රමය.

**සුදුසුකම්:**
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය මගින් පවත්වන ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදයන් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (PDTTM) හදාරා තිබීම හෝ SLQF – III හෝ NVQL – V මට්ටමේ හෝ ඊට ඉහල අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඩිප්ලෝමා පාඨමාලාවක් හදාරා තිබීම හෝ අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ගුරු/ පුහුණුකරු/ උපදේශක/ ප්‍රදර්ශක/ අධ්‍යයන සහායක/ පෙර පාසල් ගුරු සහායක ලෙස හෝ අධ්‍යාපනයට අදාල ක්ෂේත්‍රයක වසර 2 ට නොඅඩු පලපුරුද්ද හෝ විශ්වවිද්‍යාල සනාථන සභාව මගින් පිළිගත හැකි වෙනත් සමාන සුදුසුකමක්.

**පාඨමාලා ගාස්තු:** රු 75,000 ( සියලු ගාස්තු ඇතුලත්ව) පාඨමාලා ගාස්තු පළමු තෙමස තුල වාරික 3 කින් ගෙවිය හැක.

### II. ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදයන් පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව (PDTTM) - මාස 6ක සතිඅන්ත පාඨමාලාව (Professional Diploma in Teaching Technology and Methodology)

- දැනට ගුරු වෘත්තියේ නියැලෙන හා නියැලීමට අපේක්ෂිත අය සඳහා වූ SLQF –III/NVQL -V මට්ටමේ වෘත්තීය පාඨමාලාවකි.
- කාර්මික විද්‍යාල, විද්‍යා මධ්‍යස්ථාන සහ වෙනත් අධ්‍යාපන ආයතනවල කථිකාචාර්යවරුන් සහ උපදේශකවරුන් සඳහා වූ කඩඉම් සුදුසුකමක් ලෙස පිළිගත් පාඨමාලාවකි.
- ප්‍රවීණ විශ්වවිද්‍යාල ආචාර්ය මඩුල්ලක් විසින් මෙහෙයවනු ලබන නවීන ඉගැන්වීමේ ක්‍රමවේද හා තාක්‍ෂණය ශිෂ්‍ය කේන්ද්‍රිය අධ්‍යාපනක්‍රම සහිත සිද්ධාන්තික හා ප්‍රායෝගික න්‍යායන් ඇතුලත් පාඩම් මාලා 24කින් යුතු මාස 6ක සතිඅන්ත පාඨමාලාවකි.
- ඉගෙනුම් කාර්යසාධන වාර්තාවක් සහ වාචික ඉදිරිපත්කිරීම්/ අඛණ්ඩ අගැයීම් පාදක කරගත් අවසාන අගැයීම් ක්‍රමය.

**සුදුසුකම්**
අ.පො.ස උසස් පෙළ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 2 කින් සමත්ව තිබීම (විෂයයන් 4 ක් සඳහා පෙනීසිටි සිසුන් ඉන් තුනකින් සමත්ව තිබීම) හෝ අ.පො.ස සා.පෙළ සමත්වීම සමග පොදු/ අර්ධරාජ්‍ය/ රාජ්‍යනොවන /පුද්ගලික ආයතනයක වසර 02 ක වෘත්තීය පලපුරුද්ද හෝ විශ්වවිද්‍යාලීය සනාථන සභාව මගින් පිළිගත හැකි වෙනත් සමාන සුදුසුකමක්.

**පාඨමාලා ගාස්තු:** රු. 40,000 ( සියලු ගාස්තු ඇතුලත්ව) පාඨමාලා ගාස්තු පළමු තෙමස තුල වාරික 2 කින් ගෙවිය හැක.

**බඳවාගැනීමේ අයදුම්පත්:** http://sdc.wyb.ac.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ sdc@wyb.ac.lk යන විද්‍යුත් තැපැල හරහා අයදුම්පත් ලබාගත හැක. නැතහොත් පහත දැක්වෙන ලිපිනයට තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් ගෙන්වා ගත හැක. සම්පූර්ණ කරන ලද අයදුම්පත් සදුසුකම්, තහවුරු කිරීම සඳහා අවශ්‍ය සහතිකවල පිටපත් සමග පහත, ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතුය. **අයදුම්පත් එවියයුතු ලිපිනය: අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල, 60170**

**විමසීම්:** අධ්‍යක්ෂ, කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, (031) 229 9873 (කාර්යාලය), 071 373 0495/077 433 9224 (ජංගම) විද්‍යුත් තැපෑල: sdc@wyb.ac.lk, හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/පොදුසහාය ඒකකය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, 031 229 8111 (කාර්යාලය) 071 438 0159 (ජංගම) ෆැක්ස් 031 229 8111

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 2017 සැප්තැම්බර් 30**